4

# කිරි කෑ හැටි



"යසෝමා, මට අද වෙන දට වඩා කලින් කන්තෝරුවේ වැඩට යන්න තියෙනවා, මම අද කොළඹින් දවල් බත් කන්නම්," යැයි කන්නාඩිය ළඟට වී ටයි පටිය බෙල්ලේ බඳිමින් සිටි කුමාරගුප්ත කීවේ ය.

"ඉක්මනට කෑම ටික ලෑස්ති කරලා දෙන්න පුළුවනි, කාලා යන්න, දීකිරිත් තියෙනවා," යි යසෝමා කීවා ය.

"කොයින් ද කිරි?" යි ඇසූ කුමාරගුප්ත, තමා අසල වූ පුටුවෙහි වාඩි වී කලිසම අතට ගත්තේ ය.

"අම්මා එවා තිබුණා."

"එහෙනම් කිරි හොඳට ඇති, ටිකක් කන්න ඕනෑ," යි කුමාරගුප්ත සන්තෝෂයෙන් කී ය.

කුමාරගුප්ත බළලෙකු මෙන් දීකිරට ආශා කරන්නෙකි. කොළඹ දී දවල් බත කන්ට සිතා ගෙන ඇඳ පැලඳ ගත් ඔහු නැවැත්විය හැකි වූයේ දීකිරි මතක් කළ බැවිනි. නැතිනම්, "මට දවල් වෙනවා. කොළඹින් දවල් බත් කන්නම්," යි කියා පිටත්ව යනු නිසැක ය.

කුමාරගුප්ත කලිසම දැතින් අල්ලා ගෙන එය අඳින්ට සැරසෙත් ම යසෝමා කුස්සියට දිව ගියා ය.

"කුස්සි අම්මේ, ඉක්මනට කෑම ටික ලෑස්ති කරන්න. අද කලින් බත් ටික කාලා මහත්තයා කොළඹ යන්න හදනවා," යි කියමින් යසෝමා කුස්සියෙහි වූ බංකුවක් උඩ වාඩි වී ව්‍යංජනයක් යොදන්නට වූවා ය.

"බතයි, එළවළුවකුයි විතරයි නෝනා උයලා ඉවර වුණේ," යි පිළිතුරු දුන් කුස්සි අම්මා, යසෝමා යොදු දුන් මාළුව සහිත ඇතිලිය වහා ළිප උඩ තැබුවා ය.



"කමක් නෑ. සම්බලක් හදලා, ඉව්ව්ච දෙයක් මෙහේට එවන්න. ගමින් එවාපු කිරිත් තියෙනවා නොවැ," යි කියමින් යසෝමා, ආපසු ගොස් මේසය සැරසිලි කළා ය.

කුමාරගුප්ත ඇඳ පැලඳගෙන තමාගේ පස් හැවිරිදි පුත්‍රයාත් සමඟ ඇවිත්, මේසය වටා වූ පුටුවලින් එකක වාඩි ගෙන පුත්‍රයා ද ළඟින් වාඩි කරවා ගත්තේ ය. මේසයට ටිකක් ඈතින් වූ 'වට්නොටය' උඩ තිබුණු වීදුරු ඉලත්තට්ටුවක මතුයෙහි, ගොක්කොළ පිළිවැස්සෙන් වැසී සිටි කිරිමුට්ටිය, තමාට හිමි ගරු අසුන ලැබ සිනාසෙන්නාක් මෙන් පෙනිණ.

තම සැමියා සහ කුඩා පුත්‍රයාත් බත් කන්ට වාඩි වූ බැවින් යසෝමා වහා කුස්සියට දිව ගොස්, එහි දුමේ එල්ලී සිටි ලොකු පැණිමුළක් ගෙනැවිත් බැමි බුරුල් කොට, පැණි ටිකක් පෙරා ජග්ගුවකට වත්කළා ය.

"කදිම පැණි ටික! කුණු මොකුත් නැහැ, උකු යි, රන්වන් පාට යි" යි කියමින් යසෝමා පැණි ජග්ගුව ද, වට්ටෝනොටය උඩ වූ තසිමෙහි තැබුවා ය.

මේ අතරතුර බත් කා ඉවර කළ කුමාරගුප්ත කිරි කෑමට සූදනම් වූයේ ය. ඔහු තමා ඉදිරියෙහි වූ සුදු බොකුටු පිඟාන ද හැන්ද ද ඉඳුල් කඩින් දෙතුන් වරක් පිස දමුවේ, සිහසුන අරා හිඳගත් කුමාරයකු මෙන් වට්ටෝනොටයේ වීදුරු ඉලත්තට්ටුව උඩ වූ කිරිමුට්ටිය දෙස බලමිනි. ඔහුගේ කුඩා පුත්‍රයා, ටික වේලාවක පටන් බෙදගත් බතින් දෙතුන් කටකට වඩා නොකෑවේ ය. ඔහු කුඩා වුව ද දීකිරි කෑමට තම පියාට දෙවැනි නොවන බළලෙකි.

කුමාරගුප්ත ද කෑවේ බත් ටිකකි. ඔහු හැන්ද පිස දමූ ආකාරයෙන් ද, තල්ල මැරූ විධියෙන් ද, තොල කට ලෙව කෑ සැටියෙන් ද, කිරිමුට්ටිය සම්පූර්ණයෙන් ම වුවත් කාදැමීමට නුපුළුවන් එකෙකැයි කිසිවකුට කිව හැකි නොවී ය.

"සිරිමල්, මේ කිරි ලැබුණේ කොහෙන්ද යි දන්නවා ද?" කුමාරගුප්ත සරදමට මෙන් පුත්‍රයාගෙන් ඇසී ය.

"ඔව්. ආච්චි එවා තිබුණා!"

"ආච්චිලාගේ දිහාවේ ගොහින් හිටියොත් හැමද ම කිරි කන්න පුළුවනි, සිරිමල් යනවා ද?"

"ඔව්" යි කියමින් කුඩා දරුවා සිනාසිණි.

මේ අතර කිරිමුට්ටිය ගොක්කොළ පිළිවැස්සෙන් එළියට ගෙන එහි කඩවැස්ම ඉවත් කළ යසෝමා....

"දෙයියෝ සාක්කි!" යි කියමින් සිනා සෙන්නට වූවා ය.

"ඇයි, පණුවො ඉන්නව ද? එකෙක් දෙන්නෙක් හිටියට

කමක් නැහැ. උන් අහක් කරලා ගන්න,'' යි කුමාරගුප්ත කී ය.

''හොඳයි, කිරි කැවා!'' යි කියූ නමුත් යසෝමාට ඇගේ සිනාව නම් නවතාගත නොහැකි වී ය.

කුමාරගුප්තට තම බිරිඳ සිනාසෙන්නේ කුමක් නිසා දැයි යන්තම් අනුමානයෙන් මෙන් සිතා ගත හැකි වූයේ ''හොඳයි කිරි කැවා!'' යන වචන ඇසූ විට ය.



''මාළු ද?''

''ජාඩි!'' යැයි කියමින් යසෝමා යළිත් සිනාසෙන්නට වූවා ය.

කුමාරගුප්ත පුටුවෙන් නැංගේ සිනාසෙමින් වුව ද මැඩගත් කෝපය ද ඇති ව ය. ඔහුගේ කුඩා පුත්‍රයාගේ සඳ-වන් සොම්නස් මුහුණ දෙම්නස් වැහි වලාකඩින් වැසිණ. හැන්ද මේසය උඩ තැබූ සිරිමල්ගේ හිස බලාපොරොත්තු සුන් වූවකුගේ මෙන්, එක් පැත්තකට හැරී ඇලවිණි.

යසෝමා කිරිමුට්ටියට හිමි අසුන උදුරාගෙන, එහි මෙතෙක් වේලා වැඩ සිටි, ජාඩිමුට්ටිය ගෙන ගොස් කුස්සියෙහි තැබුවා ය. ''ඇයි, කලින් දැනගන්න බැරි වුණා ද?'' යි කුමාරගුප්ත යළිත් මේසය කරා ගිය තම භාර්යාවගෙන් අසන්තෝෂයෙන් මෙන් ඇසී ය.

''ගමින් ආ කොලුවෙකු අත එවා තිබුණා. එයා මුට්ටියත් තවත් පාර්සල් දෙකකුත් ගෙනැත් දීලා ගියා, මොකුත් කීවේ නෑ.

ගොක්කොළ පිළිවැස්සක් ඇතුළේ දමා තිබුණ නිසා මම හිතුවේ වෙනද වගේ අම්මා කිරිමුට්ටියක් එවලා වෙන්න ඇත කියා. කලින් බැලුවේ නැත්තේ ඒ හින්දයි,'' යි යසෝමා සිනාව අමාරුවෙන් මැඩගෙන කීවා ය.

***මාර්ටින් වික්‍රමසිංහ***

***- පව්කාරයාට ගල් ගැසීම -***

## අවබෝධය

1. යසෝමා ජාඩිමුට්ටියකට කිරිමුට්ටියක් යැයි රැවටුණේ කුමක් නිසා ද?

2. පහත දක්වෙන සිදු වීම්, කතාවේ එන අනුපිළිවෙළින් සකස් කර අංක යොදා නැවත ලියන්න.
   - ♦ කුමාරගුප්ත කන්තෝරුවට යාමට සූදනම් වීම
   - ♦ පැණිමුළෙන් පැණි ගෙන ජග්ගුවට වත් කිරීම
   - ♦ මුට්ටිය පිළිවැස්සෙන් ඉවත් කිරීම
   - ♦ දීකිරි තිබෙන බව කී විට කුමාරගුප්ත දවල් කෑම කෑමට තීරණය කිරීම
   - ♦ මුට්ටියේ ඇත්තේ කිරි නොව ජාඩි බව දැකීම
   - ♦ යසෝමා ඉක්මනින් කෑම මේසය සූදනම් කිරීම

3. කුමාරගුප්ත දීකිරි කෑමට ඉතා කැමති බව හැඟවෙන වාක්‍ය තෝරන්න. ඉදිරියෙන් ✓ හෝ x ලකුණ යොදන්න.

| | |
|---|---|
| i. කිරි හොඳට ඇති. ටිකක් කන්න ඕනැ. | ...... |
| ii. මට දවල් වෙනවා. කොළඹින් බත් කන්නම්. | ...... |
| iii. අද කලින් බත් කාලා මහත්තයා යන්න හදනවා. | ...... |
| iv. කුමාරගුප්ත සුදු බොකුටු පිඟාන ද හැන්ද ද පිස දමුවේ කිරිමුට්ටිය දෙස බලමිනි. | ...... |

4. සිරිමල් මෙම සිද්ධිය ආච්චිට කියන ආකාරයෙන් කතාව කියන්න.

## භාෂා ක්‍රියාකාරකම්

5. පාඩමේ යෙදී ඇති වචන සොයා හිස් තැන් පුරවන්න.

   i. කුමාරගුප්ත .................... මෙන් දීකිරට ආශා කරන්නෙකි.

   ii. ගොක්කොළ පිළිවැස්සෙන් වැසී සිටි කිරිමුට්ටිය තමාට ................ මෙන් පෙනිණ.

   iii. කුඩා වුව ද ඔහු (සිරිමල්) ............... බළලකු වැනි ය.

   iv. කුඩා පුත්‍රයාගේ සඳ වන් ........................ දෙම්නස් වැහි වලාකඩින් වැසිණ.

   v. සිරිමල්ගේ හිස ................ මෙන් එක් පැත්තකට හැරී ඇල විණි.

6. පහත දක්වෙන්නේ අප්‍රාණවාචී නාම පද කිහිපයකි. ඒක වචන හෝ බහු වචන නාම පද ලියමින් හිස් තැන් පුරවන්න.

| ඒක වචන | බහු වචන |
|---|---|
| මුට්ටිය | .......................... |
| කන්නාඩිය | .......................... |
| .......................... | පුටු |
| පිහාන | .......................... |
| හැන්ද | .......................... |
| ඇතිලිය | .......................... |
| .......................... | පාරවල් |
| .......................... | බැමි |
| කලිසම | .......................... |

7. සුදුසු ක්‍රියා පදය තෝරා හිස් තැන් පුරවන්න.

i. කුමාරගුප්ත කලිසම අතට .....................

ii. ඔහු කිරි කෑමට සූදනම් ..................

iii. ඔහු පුටුවක වාඩි වී පුත්‍රයා ළඟින් වාඩි කරවා ......................

iv. යසෝමා කුස්සිය පැත්තට .......................

v. ඈ ජාඩිමුට්ටිය ගෙන කුස්සියෙහි ......................

| | | | |
|---|---|---|---|
| ගත්තේ ය. | තැබුවා ය. | වූයේ ය. | ගියේ ය. |
| ගත්තා ය. | වූවා ය. | තැබුවේ ය. | ගියා ය. |

## පැවරුම්

1. මේ වෙනස්කම් සිදු කරන්නේ කෙසේ දැයි සොයා බලන්න.

i. කිරිවලින් දීකිරි සෑදීම.

ii. මාළුවලින් ජාඩි සෑදීම

iii. මාළුවලින් කරවල සෑදීම.

2. (අ) පහත දැක්වෙන ආකාරයේ වගුවක් සකස් කර ගන්න.

(ආ) මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ පොතක් කියවා ඒ පිළිබඳ කරුණු වගුවෙහි ඇතුළත් කරන්න.

| පොත කියවූ දිනය | පොතේ නම | ඇතුළත් වන කරුණු කෙටියෙන් | සිත් ගත් අවස්ථා / වර්ණනා |
|---|---|---|---|
| | | | |